සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.

**I කොටස**

- ඉරි ඇඳි යෙදුම්වලට වඩාත් උචිත අර්ථය තෝරන්න.

(01) වනාන්තරයේ අතරමං වූ මගියාට <u>තරු විසිවුණේ</u> තනි අලියා දැකීමෙනි.

1. බිය නැති වූයේ
2. ආලෝකයක් ඇති වූයේ
3. අධික බියට පත්වූයේ
4. තනිකමක් ඇති වූයේ

(02) ලිපිකරු සිය අරමුණ ඉටු කර ගැනීමට <u>අන්තිම ඉත්තත්</u> ඇද්දේ ය.

1. අවසන් උත්සාහයත් දැරී ය.
2. නිෂ්ඵල ක්‍රියාවක නිරත විය.
3. පළමු උත්සාහයක් දැරී ය.
4. අපේක්ෂා බිඳ ගත්තේ ය.

- හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(03) උස් බිම්වල නාය යෑම් වළක්වා ගැනීමට පස ............ කළ යුතු ය.

1. වියෝජනය 2. සංරක්ෂණය 3. මිශ්‍රණය 4. ඉවත් කිරීම

(04) අනුරාධපුර යුගයේ සඳකඩ පහණ පැරණි නිර්මාණ .......... පිළිබිඹු කරන්නකි.

1. චින්තනය 2. පරිණත බව 3. කෞශල්‍යය 4. අභිමානය

- නිවැරදි වාක්‍යය තෝරන්න.

(05)
1. කම්කරුවෝ වැඩ වර්ජනය කරනු ලබති.
2. විදුලි බුබුළු රාශියක් නගරය ආලෝකවත් කරති.
3. රජතුමා ගම් වැසියන්ට සහනාධාර දුන්හ
4. ඇතැමෙක් නිකරුණේ කාලය ගත කළහ.

(06) A - "අනුන් කරන දෙය බලා තමා ද එය කිරීම"
B - "කෙනෙකු කළ සේවය සඳහා කරන ගරු කිරීම"

ඉහත A හා B සඳහා යෙදිය හැකි තනි පද වන්නේ,

1. අනුකරණය හා උපහාරය යි.
2. අනුමානය හා ආචාරය යි.
3. ආරෝපණය හා බුහුමන යි.
4. නිරීක්ෂණය හා කෘතවේදී බවයි.

- ඉදිරියෙන් දී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(07)
1. බහුඅර්ථ පද - කර , තිර , වග , දිය
2. යුගල පද අඩුම කුඩුම , උඩ යට , කරදර , එහා මෙහා
3. සර්ව නාම පද ඔවුහු , අපි , තොපි , ඔහු
4. උපසර්ග පද සංවාද , නිදොස් , සුහද , අසිරි

(08) "එක් කරදරයකට පත් වී සිටිය දී තවත් කරදරයක් සිදු වීම " යන අදහස දෙන ප්‍රස්තාව පිරුළ කුමක් ද ?

1. අඹරා සිල් ගත්තා වගේ
2. පනින රිළවුන්ට ඉණිමං බැන්දා වගේ
3. තැනේ හැටියට ඇණේ ගැසුවා වගේ
4. ගහෙන් වැටුණු මිනිසාට ගොනා ඇන්නා වගේ

- මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(09)
1. සමබර ,දෙරණ,විශිෂ්ට,විද්‍යාලය
2. ප්‍රකාශන, අබරණ, නිධාන ,පරාක්‍රම
3. නිරීක්ෂණ, ගවේෂණ, අරුත, ත්‍යාගය
4. අක්ෂර ,ලේකම්,පරිගණක ,ස්තූපය

(10) වැ<u>සි</u> , <u>ශා</u>ස්ත්‍ර , නි<u>ෂ්</u>පාදන යන වචනවල ඉරි ඇඳි අක්ෂර හඳුන්වන නම් අනුපිළිවෙළ වන්නේ,

1. දන්තජ, තාලුජ ,මූර්ධජ
2. තාලුජ,දන්තජ,මූර්ධජ
3. මූර්ධජ,තාලුජ,දන්තජ
4. දන්තජ,මූර්ධජ,තාලුජ

(11) පහත දැක්වෙන පද අකාරාදී පිළිවෙළට සැකසූ විට <u>අවසානයට</u> යෙදෙන පදය කුමක් ද ?

හරිත , රුවල , කුඩය , තරුව , ඡේදය

1. රුවල
2. ඡේදය
3. හරිත
4. කුඩය

- පහත සඳහන් වචනවල හිස්තැනට ගැළපෙන අක්ෂර පිළිවෙළින් යෙදී ඇති පේළිය සොයන්න.

(12) පරි....ණක , ප්‍රාර්....නා , උච්....රණ , පිළියෙ.....

1. ස,ථ,ජා,ළ    2. ග,ත,ජා,ල
3. ග,ථ,චා,ල    4. ස,ත,චා,ළ

(13) "දකුණු අතිනුත් රැගෙන මුගුරක් මහත් ඇස් ඉස් රවාලා - අකුණු හඬ සේ ගසන බෙර පද තාලයට පා තබාලා"

මෙහි සඳහන් වන උපමාව හා උපමේය වන්නේ,

1. අකුණු හඬ - මුගුර    2. මුගුර - රවාලා
3. බෙර පද - පා තැබීම    4. අකුණු හඬ - බෙර පද

(14) "කුරුල්ලෝ , කාන්තාවක්" යන පදවල අනුක්ත පද වන්නේ,

1. කුරුල්ලන්,කාන්තාවෝ    2. කුරුල්ලන්,කාන්තාවක
3. කුරුල්ලා, කාන්තාවන්    4. කුරුල්ලකු ,කාන්තාවන්

(15)

| | | | | |
|---|---|---|---|---|
| A | - | ආශිර්වාද ක්‍රියා | = | පැන පැන |
| B | - | විධි ක්‍රියා | = | කියනු මැනවි |
| C | - | පූර්ව ක්‍රියා | = | පිපීයන් |
| D | - | මිශ්‍ර ක්‍රියා | = | නටා |

ඉහත ප්‍රකාශ අනුව නිවැරැදි ව ගළපා ඇති ක්‍රියා පද වර්ගය වන්නේ,

1. D ය.    2. C ය.    3. B ය.    4. A ය.

(16) පහත සඳහන් යෙදුම්වල ඇතුළත් වන 'ජාති නාමයක්' හා 'ද්‍රව්‍ය නාමයක්' වන්නේ,

1. ගොටුකොළ - දර    2. ගල් - ලියන
3. දක්ෂ - මැටි    4. පොත් - මහත

(17) 'දරුවා' මෙහි යෙදී ඇති පිල්ලම් වර්ග නම් කරන්න.

1. ඇලපිල්ල - කෙටි ඇදය    2. කෙටි පාපිල්ල - ඇලපිල්ල
3. ඇදය - පාපිල්ල    4. පාපිල්ල - ඉස්පිල්ල

(18) පුරුෂත්‍රයට අයත් නොවන පදයක් ඇති පද පේළිය තෝරන්න.

1. නුඹ,මිනිසා,තොපි,ඔවුහු
2. නුඹලා,මම,ඔහු,ඇය
3. අපි,තොටියා,ඔහු,නුඹ
4. ඔවුහු,අපි,හෙවත්,ඔබ

(19) මුලින් දී ඇති පදයේ විරුද්ධාර්ථය දෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

1. අභ්‍යන්තර - ඇතුළත , අබියස , අභිප්‍රාය , අභීත
2. රෝගී - ලෙඩ , අසනීප , ගිලන් , සාගිනි
3. සතුට - තුට , සොම්නස , ආනන්දය , භාග්‍යය
4. ආලෝකය - ප්‍රභාතය , අරුණ , තිමිර , එළිය

(20) 'විල්තෙර මරණය' කෙටි කතා සංග්‍රහය රචනා කළ කතුවරයා වන්නේ,

1. ගුණදාස අමරසේකර යි.
2. රෝහණ දන්දෙණිය යි.
3. ඒ.පී.ගුණරත්න යි.
4. හාන්ස් ක්‍රිස්ටියන් ය.

(ලකුණු 02 x 20 = 40 යි.)

## <u>II කොටස</u>

- 1 හා 2 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම **අනිවාර්ය** වේ.
- 03 , 04 , 05 , 06 , 07 ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න.

(01) ඉගෙනුම් අවස්ථාවක් ලෙස පෙළ පොතේ ප්‍රායෝගික අභ්‍යාසවල ඇතුළත් වන බිත්ති පුවත්පතක් නිර්මාණය කිරීමට ඔබ කණ්ඩායමට අවස්ථාවක් ලැබිණි.ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.

1. බිත්ති පුවත්පත නිර්මාණය කිරීමේ දී යොදාගත් මාතෘකාව කුමක් ද? (ලකුණු 01යි)
2. බිත්ති පුවත්පතෙහි නිර්මාණ සඳහා තොරතුරු රැස් කරගත් ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)
3. ඔබ කණ්ඩායම බිත්ති පුවත්පතට ඉදිරිපත් කළ නිර්මාණ තුනක් නම් කරන්න. (ලකුණු 03යි)
4. මෙම නිර්මාණය සැලසුම් කර ගැනීමේ දී මුහුණ දුන් ගැටලු තුනක් ලියන්න. (ලකුණු 03යි)
5. මෙවැනි ක්‍රියාකාරකමකින් ඔබ ලත් කුසලතා තුනක් ලියන්න. (ලකුණු 03යි)
6. ගුරු භවතාගෙන් ඔබට ලැබුණු උපදෙස් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(මුළු ලකුණු 16 යි)

(02) පහත සඳහන් මාතෘකාවලින් <u>එකක්</u> තෝරා ගෙන **<u>වචන 150කට නො අඩු වන සේ</u>** රචනයක් ලියන්න.

1. මා සිත් ගත් වීර චරිතය
2. ආහාර පාන හා නීරෝගිකම
3. මා කැමතිම රූපවාහිනී වැඩසටහන
4. ජන කවි රස විඳිමු
5. ගං වතුර දවසක අපේ ගම

(ලකුණු 14 යි)

(03) ලොව පුරා පැතිරී යන කොරෝනා රෝගයෙන් වැළකීම සඳහා අනුගමනය කළ යුතු <u>පිළිවෙත්</u> දක්වමින් ඔබ පාසලේ සහෝදර සිසු/සිසුවියන් දැනුවත් කිරීමට <u>සුදුසු</u> <u>දැන්වීම් පත්‍රයක්</u> සකස් කරන්න.(ඔබ, පාසලේ සෞඛ්‍ය සංගමයේ ලේකම් යැයි සිතන්න.)

**නැතහොත්,**

පාසලේ දිනපතා එකතු වන කැළි කසළ එකතු කර කාබනික පොහොර නිෂ්පාදනයට සුදුසු ස්ථානයක් හා උපදෙස් සැලසුම් කර දෙන ලෙසට (පාසලට පැමිණ) ප්‍රදේශයේ කෘෂි පර්යේෂණ නිලධාරිතුමාට,'ගොවි ජන සේවා මධ්‍යස්ථානය' වෙත යවන රාජකාරි ලිපිය සකස් කරන්න.(ඔබ පාසලේ පරිසර නියමු හට කණ්ඩායම් නායක හෝ නායිකාව බව සිතන්න.)

(ලකුණු 10 යි)

(04) පහත සඳහන් ප්‍රශ්නවලට,පෙළ පොත ඇසුරින් පිළිතුරු සපයන්න.

1. "ළිප ගිනි මොළොවන තෙක් දිය සැළියේ
සැපයක් යැයි කකුළුවා දිය කෙළියේ"

අ). ඉහත කොටස උපුටා ගත් උපදේශ කාව්‍ය කෘතිය කුමක් ද ?
ආ). එහි කතුවරයා කවුරුන් ද ?

2. "මං කිව්වේ,මං කිව්වේ හූනා කියන්න වගේ මූ ඇවිත් තියෙන්නෙ නම් ලොකු මගෝඩියකට බව"

අ). මෙම අවස්ථාව උපුටාගත් නිර්මාණය කුමක් ද?
ආ). මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් ද?

3. "කෙසෙල් පට්ටා සහ පිදුරු ද මෙම නිෂ්පාදනයේ අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනේ."

අ). ඉහත කොටස උපුටා ගත් පාඩම නම් කරන්න.
ආ). එම පාඩමට මූලාශ්‍ර වූ ලිපියේ කතුවරිය කවුරුන් ද?

4. "මේ ඇවිල්ල ඉන්නේ නැති වුණ දෙයක් ගැන අහන්නයි."

අ). මෙහි සඳහන් වන්නේ කාගේ ප්‍රකාශයක් ද ?
ආ). මෙසේ ප්‍රකාශ කරන්නේ කාහට ද ?

5. "එහෙනම් අපේ අම්මට කියන්න, හෙට කොහොම හරි මාව එක්ක යන්න එන්න කියලා."

අ). මේ කාගේ ප්‍රකාශයක් ද ?
ආ). එම ප්‍රකාශය කරන්නේ කවුරුන්ට ද ?

(ලකුණු 02 x 5 = 10)

(05) පහත සඳහන් කවි වලට **<u>සුදුසු ඉතිරි පද දෙක බැගින්</u>** නිර්මාණය කරන්න.

1. ........................................... ..........
........................................... ..........
අසල වැවේ සඳ පායන තුරු වරෙක
වෙරළ දිගේ සෙල්ලම් කරමුද හනික

2. සුළි කුණාටුව සැහැසි කරලා
................................. ..........
................................. ..........
මහලු ගස් වැල් කඩා වැටිලා

3. අතු කඩා මල් රැගෙන ගිහිං තිබු       හින්දා
බොර වෙලා වැව් දිය ම දුක් අඳුර       වින්දා
...................................................       ..........
...................................................       ..........

4. වසර අටක් ගතවුණි නොදැනිම       වාගේ
.................................................       .........
.................................................       .........
නුවන කඳුළු වැගිරේ පිණිකැට       වාගේ

5. .................................................       ............
.................................................       ............
අත හැර බේද ලොව දන එකමුතු       වීමෙන්
පියවර තබමු සාමයේ මඟ       ඉවසීමෙන්

(ලකුණු 02 x 5 = 10)

(06) හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

1. තාත්තා හෝ අම්මා හෝ දිවා ආහාරය ............ (ගත්තාය / ගත්තේය )
2. සරුංගල් සමූහය අහසේ ඉහළට ඇදී ............( යති / යයි )
3. ඔබ දක්ෂයෙක් ............. (වන්නේය / වන්නෙහි)
4. ඇතැමෙක් මේ දිනවල කාබනික පොහොර නිෂ්පාදනය ............. (කරති / කරයි)
5. හෙදියන් විසින් එන්නත්කරණය ............ (සිදු කරයි / සිදු කෙරෙයි)

(ලකුණු 02 x 05 = 10 යි)
(මුළු ලකුණු 60යි)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

වගා බිමේ යොදන රසායනික පොහොර හා කෘමි නාශක වර්ගවලින් ආරම්භ වී අස්වැන්න පාරිභෝගිකයා අතට පත්වන තුරු වන අතරමැදි ක්‍රියාවලියන්හි දී යොදන කල් තබා ගැනීමේ රසායනික ආදිය ඇතුළු සියලු ම ක්‍රියාවන්වල දී ආහාරයක් අනාරක්ෂිත වීම සිදුවිය හැකි ය.

අතීතයේ පැවති කාබනික වගාව ක්‍රමයෙන් වෙනස් වීම මෙයට හේතුව බව සඳහන් කළ හැකි ය.අතීතයේ රසායනික පොහොර වර්ග,හෝර්මෝන වර්ග,කෘමි නාශක,වල් නාශක ආදිය භාවිතයේ නොතිබිණි.ක්‍රමයෙන් ආහාරවලට පවතින ඉල්ලුම වැඩි වෙත්ම අපට අස්වැන්න ඉහළ දමා ගන්නා ක්‍රමවේද අනුගමනය කරන්නට සිදුවිය. ඒ අනුව දෙමුහුන් භෝග වගාවට යොමු වීමට සිදුවිය.එම භෝගවලට කෘමීන්ගෙන් සිදුවන හානිය ඉහළ බැවින් කෘමි නාශක භාවිත කරන්නට ගොවියන්ට සිදුවිය.එසේම අස්වැන්න ඉහළ දමා ගැනීම සඳහා රසායනික පොහොර භාවිතයට යොමු වීම මත ආහාර වලට බැර ලෝහ එකතු විය.මෙලෙස ඉතා අමාරුවෙන් ආරක්ෂා කර නෙළා ගන්නා අස්වැන්න ද කල් තබා ගැනීමට ක්‍රමයක් ලෙස රසායනික ද්‍රව්‍ය භාවිත කිරීමට යොමු විය.

අතීතයේ කල් තබා ගැනීම වෙනුවෙන් භාවිත කළ ක්‍රම වන දුම් ගැසීම, වේළීම වැනි ක්‍රම භාවිතයෙන් ඉවත් විය.වර්තමානය වන විට මෙලෙස රසායනික භාවිතය සාමාන්‍ය තත්ත්වයක් බවට පත් වූවද ඒවා සිදු කළ හැක්කේ ජාත්‍යන්තර හා දේශීය වශයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රමිතීන් වලට අනුව ය.

1. මෙහි සඳහන් පරිදි 'ආහාරයක්' අනාරක්ෂිත වන ක්‍රම **දෙකක්** ලියන්න.
2. අස්වැන්න ඉහළ දැමීමට මෙහි යොදා ගත් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
3. අතීතයේ ආහාර කල් තබා ගත් ක්‍රම මොනවා ද ?
4. ඡේදයට අනුව රසායනික ද්‍රව්‍ය සාමාන්‍ය තත්ත්වය යටතේ භාවිත කළ හැක්කේ කෙසේ ද ?
5. අර්ථ දක්වන්න.

අ). අනාරක්ෂිත -
ආ). ප්‍රමිතිය -

(ලකුණු 02 x 05 = 10 යි)

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම - 2021
සිංහල භාෂාව හා සාහිත්‍යය

8 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1 | 3 |
| 2 | 1 |
| 3 | 2 |
| 4 | 3 |
| 5 | 4 |
| 6 | 1 |
| 7 | 2 |
| 8 | 4 |
| 9 | 2 |
| 10 | 1 |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 11 | 3 |
| 12 | 3 |
| 13 | 4 |
| 14 | 2 |
| 15 | 3 |
| 16 | 1 |
| 17 | 2 |
| 18 | 4 |
| 19 | 4 |
| 20 | 1 |

(ලකුණු 02 x 20 = 40)

II කොටස

(01) අසා ඇති ප්‍රශ්නවලට උචිත ලෙස පිළිතුරු ලබා දී ඇත්නම් ලකුණු පිරිනමන්න.
(ලකුණු 16 යි)

(02) රචනා - (මුළු ලකුණු 14 යි)

- කරුණුවල සාරවත් බව (ලකුණු 05 යි)
- සංවිධානය, නිර්මාණශීලි බව (ලකුණු 06 යි)
- ව්‍යාකරණානුකූල බව (ලකුණු 03 යි)

(03) දැන්වීම පත්‍රය

- කරුණු නිවැරදිව,පැහැදිලි ව දැක්වීම.
- සංක්ෂිප්ත බව,ආකර්ෂණීය බව පිළිබඳව අවබෝධය සලකා බලා ලකුණු ලබා දෙන්න.

නැතහොත් ,

රාජකාරි ලිපි

- ආකෘතිය (ලකුණු 03)

- අන්තර්ගතය (ලකුණු 05)
- ශිල්පීය දක්ෂතා (ලකුණු 02)

(රාජකාරි ලිපියකට අදාළ නිර්ණායක සලකා බලා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 10 යි)

(04) 1. අ). ලෝවැඩ සඟරාව
ආ). වීදාගම මෛත්‍රී හිමි

2. අ). පරාස්ස නාට්‍යය
ආ). පුරංසිනා

3. අ). පරිසර හිතකාමී කඩදාසි
ආ). සාවිත්‍රී රණසිංහ

4. අ). සාස්තරකරුගේ
ආ). එතනහාමිට හා ඩිංගිරාළට

5. අ). පියසේනගේ
ආ). වෙළෙන්දාට

(ලකුණු 02 x 05 = 10 යි)

(05) නිර්මාණශීලී භාවිතය, උචිත ගැළපීම වැනි සාධක සලකා බලා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 02 x 05 = 10 යි)

(06) 1. ගත්තාය
2. යයි
3. වන්නෙහි
4. කරති
5. සිදු කෙරෙයි

(ලකුණු 02 x 05 = 10 යි)

(07) 1. රසායනික පොහොර යෙදීම / කෘමි නාශක භාවිතය / කල් තබා ගන්නා රසායනික ද්‍රව්‍ය භාවිතය
2. දෙමුහුන් භෝග වගාවට යොමු වීම / කෘමි නාශක භාවිතය / රසායනික පොහොර භාවිතය
3. දුම් ගැසීම / වේළීම
4. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රමිතීන්ට අනුව යි.
5. අනාරක්ෂිත - ආරක්ෂා විරහිත / ආරක්ෂාවක් නැති
ප්‍රමිතිය - තත්වානුකූල බව

(සමාන අර්ථ ඇති වෙනත් පිළිතුරු සඳහා ලකුණු දෙන්න.)

(ලකුණු 02 x 05 = 10 යි)